**වලිකාමම් බටහිර ප්‍රාදේශීය සභාව - 2021**

**------------------------------------------**

**1 මූල්‍ය ප්‍රකාශන**

**---------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**--------------------------**

වලිකාමම් බටහිර ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට වලිකාමම් බටහිර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**-----------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

**---------------------------------------------------------------------------------**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

  හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශිය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5** **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, මෙම වාර්තාවේ 1.6.1 ඡේදයේ (අ) නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | |
|---|---|---|---|
| (අ) | උතුරු පළාත් පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් පරිත්‍යාග වශයෙන් ලද රු. 328,970 ක් වටිනා යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ ප්‍රාග්ධනිත කර නොතිබීමෙන් මූල්‍ය ප්‍රකාශනයේ ස්ථාවර වත්කම් සහ ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීම අඩුවෙන් දක්වා තිබුණි. | අතපසුවීමකින් අදාල යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ ගිණුම් ගත කිරීමට නොහැකි විය. ප්‍රවර්තන වර්ෂයේ ගිණුම්වලින් හෙළිදරව් කිරීමට කටයුතු කරමි. | අදාල අඩුපාඩු නිවැරදි කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ ක්‍රියාත්මක කර නොතිබූ ව්‍යාපෘති 04 ක් සඳහා ගෙවීම් වවුචර් සකස්කර විවිධ ණය හිමියන් යටතේ ගිණුම්ගත කිරීම නිසා මූල්‍ය ප්‍රකාශනයේ රු. 2,476,120 ක අගයකින් වියදම් සහ ජංගම වගකීම් වැඩියෙන් දක්වා තිබුණි. | ව්‍යාපෘතිය සඳහා 2021.12.09 දින පුවත්පත් දැන්වීම් පළකර 2021.12.31 දින භාරගැනීමේ ලිපි නිකුත් කර විවිධ ණය හිමියන් යටතේ වෙන්කර ඇත. | ගිණුම් කරණ ප්‍රතිපත්ති අනුව අදාල කටයුතු නිමකර ඇති බව සනාථ කර සටහන් කළ බව සනාථ කළ යුතු අතර අදාල අඩුපාඩු නිවැරදි කළ යුතුය. |

### 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විෂයය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | | රු. | | | |
| (අ) | දේශීය ණය සංවර්ධන අරමුදලේ ණය පොලී ශේෂය | 1,263,700 | ආරම්භක ශේෂයේ විස්තර | දේශීය ණය සංවර්ධන අරමුදලින් ලබාගත් ණය සඳහා පොලි මුදලය. මේ සම්බන්ධයෙන් ලියවිලි හෝ තොරතුරු කිසිවක් ලබාගත නොහැකි බැවින් හිඟ මුදලක් වශයෙන් දක්වා ඇත. | මේ සම්බන්ධයෙන් ඵලදායීව කඩිනමින් කටුයුතු කළ යුතුය. |
| (ආ) | 2013 වර්ෂයේ සිට පැවත එන දේශීය ණය සංවර්ධන අරමුදලට ගෙවිය යුතු ශේෂය | 414,052 | 2013 වර්ෂයේ ශේෂයට අදාල විස්තර | දේශීය ණය සංවර්ධන අරමුදලින් ලබාගත් ණය මුදලය. මේ සම්බන්ධයෙන් ලියවිලි හෝ තොරතුරු කිසිවක් ලබාගත නොහැකි බැවින් හිඟ මුදලක් වශයෙන් දක්වා ඇත. | අදාල නීති ප්‍රතිපාදන අනුව ඵලදායීව කටුයුතු කළ යුතුය. |
| (ඇ) | ප්‍රතිපූර්ණ සංචිත | 400,000 | ප්‍රතිපූර්ණ වෙන්කිරීම් විස්තර | අදාල ප්‍රතිපූර්ණ වෙන්කිරීම් 2002 වර්ෂයට පෙර සිට ගිණුම්වල දක්වමින් තිබුණි. අදාල ලියවිලි කිසිවක් අප සතුව නොමැත. | මේ සම්බන්ධයෙන් ඵලදායීව කඩිනමින් කටුයුතු කළ යුතුය. |

**1.7 අනුකූල නොවීම්**

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනත | | | |
| වගන්තිය 158(1) | රු. 17,546,173 ක් වටිනා හිඟ වරිපනම් ශේෂය අවුරුදු 03 ක කාලයක් ගතවී ඇතත්, වරිපනම් ගෙවීම පැහැරහැර ඇති අයවලුන්ට එරෙහිව ලේකම් විසින් වරෙන්තු නිකුත්කර නොතිබුණි. | වරෙන්තු දැනට සකස් කරමින් යන අතර, 2022 ජුනි මසට ප්‍රථම නිම කිරීමට කටයුතු කරනු ලැබේ. | අදාල නීතිමය ප්‍රතිපාදනය අනුව කටයුතු කළ යුතුය. |

2. **මූල්‍ය සමාලෝචනය**

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.39,305,981 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.21,734,782 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1987 හි අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(i) වගන්තිය ප්‍රකාරව සභා බලප්‍රදේශයේ තිබෙන ඉඩම් සහ ඉදිකරන ලද නිවාස ගොඩනැගිලිවලින් අයකළ යුතු රු. 17,546,173 ක් වටිනා හිඟ වරිපනම් බදු අයකර ගැනීම සඳහා ඉකුත් වසර 03 ක සිට අවශ්‍ය කටයුතු කර ගෙන තිබුණු අතර ආරම්භක ශේෂ වශයෙන් රු. 16,912,485 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද, එය කුමන වර්ෂයට අදාලද යන්න විගණනයේදි වෙන්කරගත නොහැකි විය. | සභාවේ උප කාර්යාල හතරකින් මාසිකව ජංගම සේවය පවත්වා හිඟ වරිපනම් බදුවලින් වැඩි ප්‍රමාණයක් අයකර ගෙන ඇත. සභාවේ ආදායම් පරීක්ෂක තනතුරක පුරප්පාඩු පවතින අතර, බේරුම් නිලධාරි තනතුර සඳහා කිසිවෙක් ඉදිරිපත් නොවීම් මත දැනට සේවය කරන බේරුම් නිලධාරීන් සේවය හැරයාම හේතුවෙන් වරිපනම් බදු අයකිරීමේ සුළු ප්‍රමාදයක් සිදුවී ඇත. තවද, දැනට උප කාර්යාල මට්ටමින් කාල විශ්ලේෂන සකස් කිරීමට අවශ්‍ය කටයුතු කර ඇත. | ආදායම් රැස්කිරීමේ කළමනාකරණය ඵලදායීව සිදුකර හිඟ මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු අතර හිඟ වරිපනම් බදු සම්බන්ධයෙන් කාල විශ්ලේෂණයක් මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ සභාව විසින් ස්ථාවර තැන්පත්වල තිබෙන මුදල යොදවා සංවර්ධන කටයුතු ඉටු නොකර පොලී ආදායම් ඉපයීමේ අරමුණෙන් රු. 89,607,611 ක මුදලක් ස්ථාවර තැන්පත්වල තැන්පත් කර ඇත. | සමාලෝචිත වර්ෂයේ ස්ථාවර තැන්පත් ශේෂය රු. 89,607,611 ක මුදල සංවර්ධන වැඩ සඳහා වෙන් කර ඇත. | අරමුදල් අරපිරිමැස්මෙන් හා උපරිම මට්ටමින් සංවර්ධන කටයුතු සඳහා යොදවා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සභාව විසින් දීර්ඝ කාලීන පදනම යටතේ බදු දිය යුතු කඩ කාමර 08 ක් බදු දී නොතිබීමෙන් සමාලෝචිත වර්ෂයේ රු. 292,200 ක ආදායමක් සභාවට අහිමිවී තිබුණි. | මෙම කඩ කාමර 2022.03.02 දින උදයන්, තිනකුරල් යන පුවත්වත්වල ටෙන්ඩර් කැඳවා දැන්වීම් පළකරන ලදී. | සභාවේ වත්කම් යොදවා ආදායම් ඉපයීමට කටයුතු කළ යුතුය. |